# <u>බැඩ්මින්ටන් නීති-රීති කෙටියෙන් (Simplified Badminton Rules)</u>



## <u>කාසියේ වාසිය (Toss)</u>

- කාසියේ වාසිය අත්කරගත් (පිල) ක්‍රීඩකයා පහත දැක්වෙන අවස්ථා දෙකෙන් <u>එකක්</u> තෝරාගත යුතුය.
  - (i) මුලින් පිරිනැමීම හෝ පිරිනැමීම ලැබීමට සූදානම්වීම ( serving <u>first</u> or receiving <u>first )</u>
  - (ii) පිටියේ වාතාවරණය අනුව තමාට ක්‍රීඩා කිරීමට සුදුසු පැත්තක් තෝරා ගැනීම ( choice of the side )

## <u>ලකුණු තැබීම් ක්‍රමවේදය (Scoring System)</u>

- <u>සම්පූර්ණ තරඟයක් (Match)</u> තරඟ වට (Games) 3 කින් සමන්විත වේ
- කාන්තා කේවල, කාන්තා යුගල, පිරිමි කේවල, පිරිමි යුගල සහ මිශ්‍ර යුගල තරඟයක (match) එක් තරඟ වටයක් (a game) **<u>ලකුණු 21</u>** දී අවසන්වේ.
- එක් තරඟයකදී (match) තරඟවට (game) 3 කින් 2ක් ජයගත් පිලට ජයග්‍රහණය හිමිවෙයි.
- පිලකට (side) ලකුණක් ලැබෙන්නේ කුමන ක්‍රීඩකයෙක් හෝ ක්‍රීඩකයන් 02 ක් (යුගල තරඟ වලදී ) අදාල තරඟ අතුරු වටය (rally) ජයග්‍රහණය කල විටය.
- දෙපිලේ ලකුණු තත්ත්වය **<u>20 සමවූ</u>** විට **<u>පළමුවෙන්ම</u>** අනෙක් පිලට වඩා ලකුණු 02ක් ඉදිරියට පැමිනෙන පිලට ජයග්‍රහණය හිමිවෙයි.
- එසේ වුවත් තරඟයක් දීර්ඝ කල හැකි උපරිම ලකුණු ගනන 30කි. දෙපිලේ ලකුණු තත්ත්වය **<u>29 සමවූ</u>** විට ඊලඟ ලකුණ (30 වන ලකුණ) ලබන පිලට ජයග්‍රහණය හිමිවෙයි.
- තරඟයකදී (match), තරඟවාරයක් (game) ජයගත් පිලට ඊලඟ තරඟවාරයේ මුලින් පිරුනැමීමේ අවස්ථාව (serving first)හිමිවෙයි

## <u>විවේකකාල (Intervals) සහ පැති මාරුවීම් (Change Sides)</u>

- තරඟ වටයේ ඉහල ලකුණ (Leading Score) 11වන විට ක්‍රීඩකයන්ට **<u>විනාඩි 1</u>** <u>(තත්පර 60) ක</u> <u>විවේක</u> කාලයක් හිමි වන්නේය.
- ඕනෑම තරඟ වට (<u>Game</u>) 2 ක් අතර (Between Each Games), **<u>විනාඩි 2</u>** <u>(තත්පර 120) ක</u> විවේක කාලයක් හිමි වන්නේය.
- 3 වන තරඟ වටයේදී (3 rd Game) තරඟයේ ඉහල ලකුණ (Leading Score ) 11 වන විට ක්‍රීඩකයන් පැති (Change Sides) මාරු කරගත යුතුය. ( මෙම පැතිමාරුව අතපසුවීමකින් සිදුනොකලහොත් එම වැරැද්ද හඳුනාගත් වහාම ප්‍රධාන විනිසුරු (umpire) විසින් නිවැරදි කල යුතුය).

## <u>කේවල තරඟ (Singles)</u>




- තරඟ වටය ආරම්භයේදී (ලකුණු 0 - 0) පිරිනැමීම සිදු කරන්නා (server) <u>දකුණු අත පැත්තේ</u> <u>කොටුවේ</u> ( right service court) සිට පිරිනැමීම කල යුතුවේ.
- තමාගේ ලකුණු සංඛ්‍යාව <u>ඉරට්ටේ</u> වනවිට <u>දකුණු අත පැත්තේ</u> <u>කොටුවේ</u> ( right service court) සිට පිරිනැමීම කල යුතු අතර, ලකුණු සංඛ්‍යාව <u>ඔත්තේ</u> වන විට <u>වම් අත පැත්තේ කොටුවේ</u> (left service court) සිට පිරිනැමීම කල යුතුය.
- පිරිනැමීම සිදු කරන්නා (server) විසින් තරඟ අතුරු වටය (rally) ජයගත් විට ඔහුට හෝ ඇයට ලකුණක් හිමි වන අතර අනෙක් පිරිනැමීම් කොටුවේ සිට ඊළඟ පිරිනැමීම කල යුතු වෙයි.
- පිරිනැමීම ලබන්නා (reciever) විසින් තරඟ අතුරු වටය (rally) ජයගත් විට ඔහුට හෝ ඇයට ලකුණක් හිමි වන අතර නව පිරිනැමීම සිදු කරන්නා (new server) බවටද පත්වෙයි. ඔහුගේ හෝ ඇයගේ ලකුණු තත්වය (එනම් ඔත්තේ හෝ ඉරට්ටේ) අනුව අදාල පිරිනැමීම් කොටුවේ සිට ඊළඟ පිරිනැමීම කල යුතු වෙයි.

## <u>යුගල තරඟ සඳහා (Doubles)</u>

- වරකට එක පිරිනැමීමේ අවස්ථාවක් පමණක් පිලකට හිමිවෙයි.
- තරඟ වටය ආරම්භයේදී (ලකුණු 0 - 0) පිරිනැමීම සිදු කරන පිළ (serving side) <u>දකුණු අත පැත්තේ</u> <u>කොටුවේ</u> ( right service court) සිට පිරිනැමීම කල යුතුවේ.
- තම කණ්ඩායමේ ලකුණු සංඛ්‍යාව <u>ඉරට්ටේ</u> වනවිට <u>දකුණු අත පැත්තේ</u> <u>කොටුවේ</u> ( right service court) සිට පිරිනැමීම කල යුතු අතර, ලකුණු සංඛ්‍යාව <u>ඔත්තේ</u> වන විට <u>වම් අත පැත්තේ කොටුවේ</u> (left service court) සිට පිරිනැමීම කල යුතුය.

- පිරිනැමීම සිදු කරන පිල (serving side) විසින් තරඟ අතුරු වටය (rally) ජයගත් විට ඔවුනට ලකුණක් හිමි වන අතර කලින් පිරිනැමීම සිදු කල ක්‍රීඩකයාම අනෙක් පිරිනැමීම් කොටුවේ සිට ඊළඟ පිරිනැමීම කල යුතු වෙයි.
- පිරිනැමීම ලබන පිල (recieving side) විසින් තරඟ අතුරු වටය (rally) ජයගත් විට ඔවුනට ලකුණක් හිමි වන අතර නව පිරිනැමීම සිදු කරන පිල (serving side) බවටද පත්වෙයි. ඔවුන්ගේ ලකුණු තත්වය අනුව අදාල පිරිනැමීමේ කොටුවේ සිටින ක්‍රීඩකයා විසින් ඊළඟ පිරිනැමීම කල යුතු වෙයි.
- පිරිනැමීම සිදු කරනු ලැබූ පිළ (serving side) ලකුණක් ලබා ගත් විට පමණක් එම පිලේ ක්‍රීඩයන් දෙදෙනාගේ පිරිනැමීමේ කොටු (service courts) මාරු වෙයි.
- ක්‍රීඩකයන් විසින් සිදු කරනු ලබන පිරිනැමීමේ පිටි වැරදක් (service court error) හඳුනාගත් වහාම ප්‍රධාන විනිසුරු (umpire) විසින් නිවැරදි කල යුතුය.

## A - B සහ C-D ක්‍රීඩකයින් අතර යුගල තරඟයක තරඟ අතුරු වට (rallies) කිහිපයකදී පිරිනැමුම් පැත්ත මාරුවීම හා ලකුනු හිමිවන ආකාරය Changing Service Courts & Scoring in Doubles

(a) A සහ B පිලෙහි (Initial serving side) **A ක්‍රීඩකයා** තරඟ වටය ආරම්භයේදී C සහ D පිලෙහි (Initial receiving side) **C ක්‍රීඩකයාට** පිරිනැමීමක් (service) සිදුකරයි. ආරම්භක ලකුණු තත්ත්වය **0 – 0** (love all)




(b) C සහ D පිල තරඟ අතුරු වටය (rally)ජයග්‍රහණය කරයි.
ලකුණු තත්ත්වය **1 -0** (Service over : one - love)
C සහ D පිලෙහි ලකුණු සංඛ්‍යාව **ඔත්තේ** බැවින් වම් පිරිනැමීම් පැත්තේ (left service court) සිට **D ක්‍රීඩකයා** ( එනම් new server) **, B ක්‍රීඩකයාට** ( එනම් new receiver) පිරිනැමීමක් (service) සිදුකරයි.




(c) C සහ D පිල තරඟ අතුරු වටය (rally) ජයග්‍රහණය කරයි.
එවිට ලකුණු තත්ත්වය **2 – 0 (two- love)**
**මෙහිදී C හා D** ක්‍රීඩකයන් දෙදනා තම පිරිනැමුම් පැත්ත ( left / right Service Court) මාරු කරයි **D ක්‍රීඩකයා** (server) දකුණු පිරිනැමීම් පැත්තේ (right service court) සිට **A ක්‍රීඩකයාට** (එනම් new receiver) පිරිනැමීමක් (service) සිදුකරයි.




(d) A සහ B පිල තරඟ අතුරු වටය (rally) ජයග්‍රහණය කරයි.
එවිට ලකුණු තත්ත්වය **1 – 2** (Service over : one - two)
A සහ B පිලෙහි ලකුණු සංඛ්‍යාව **ඔත්තේ** බැවින් වම් පිරිනැමීම් පැත්තේ (left service court) සිට **B ක්‍රීඩකයා** ( එනම් new server) **, C ක්‍රීඩකයාට** ( එනම් new receiver) පිරිනැමීමක් (service) සිදුකරයි.




(e) C සහ D පිල තරඟ අතුරු වටය (rally) ජයග්‍රහණය කරයි.
එවිට ලකුණු තත්ත්වය **3 – 1** (Service over : three - one)
C සහ D පිලෙහි ලකුණු සංඛ්‍යාව **ඔත්තේ** බැවින් **වම්** පිරිනැමීම් පැත්තේ (left service court) සිට **C ක්‍රීඩකයා** ( එනම් new server) **, B ක්‍රීඩකයාට** ( එනම් new receiver) පිරිනැමීමක් (service) සිදුකරයි.




(f) A සහ B පිල තරඟ අතුරු වටය (rally) ජයග්‍රහණය කරයි.
එවිට ලකුණු තත්ත්වය **2 – 3** (Service over : two - three)
A සහ B පිලෙහි ලකුණු සංඛ්‍යාව **ඉරට්ටේ** බැවින් **දකුණු** පිරිනැමීම් පැත්තේ (right service court) සිට **A ක්‍රීඩකයා** ( එනම් new server) **, D ක්‍රීඩකයාට** එනම් new receiver) පිරිනැමීමක් (service) සිදුකරයි.




(g) A සහ B පිල තරඟ අතුරු වටය (rally) ජයග්‍රහණය කරයි.
එවිට ලකුණු තත්ත්වය **3 – 3 ( three all)**
**මෙහිදී A හා B** ක්‍රීඩකයන් දෙදනා තම පිරිනැමුම් පැත්ත ( left / right Service Court) මාරු කරයි **A ක්‍රීඩකයා** (server) වම් පිරිනැමීම් පැත්තේ (left service court) සිට **C ක්‍රීඩකයාට** ( එනම් new receiver) පිරිනැමීමක් (service) සිදුකරයි.




සම්පාදනය: http://www.internationalbadminton.org/simplify_rule.html ඇසුරෙනි

සුනිල් වික්‍රම තෙන්නකෝන්
Level II Qualified (NOC / SLBA) Badminton Coach, National Badminton Umpire (Grade 2) – SLBA, B.Sc. (Hons.), Chartered, Fellow – CIPD (U.K.)

සුමුදු ප්‍රසන්න තෙන්නකෝන්
Level II Qualified (SLBA) Badminton Coach, B.Sc. (Hons.) (Physics)

# බැඩ්මින්ටන් පිටිය හා උපකරණ
# (Badminton Court & Court Equipments)




පිටියේ විකර්ණයේ දිග ( A සිට B දක්වා)= 14.723 m

## පිහාටු පන්දුවේ (Shuttle Cock) යෝග්‍යතාව පරීක්ෂා කිරීමේ සීමා ඉරි




## බැඩ්මින්ටන් දැල (Badminton Net)




## බැඩ්මින්ටන් පිත්ත (Badminton Racket)




සාමන්‍ය බර 90g- 150g අතර වේ

## පිහාටු පන්දුව (Shuttle Cock)




- Skrit කොටසෙහි පිහාටු 16ක් තදින් සිටින සේ වෘත්තාකාරව සවිකර ඇත
- Skrit කොටස කෘතිමවද (Nylon) සාදනු ලබයි